# වී වගාව සඳහා පරිසර හිතකාමී පොහොර බෙදාහැරීමේ ක්‍රියාවලියේ නිරත සියලු පාර්ශවයන් සඳහා වූ මාර්ගෝපදේශය

# 2022 - යල කන්නය

**වැඩසටහන හා සම්බන්ධිත සියලුම නිලධාරීන් වෙත**

**2022 - යල කන්නයේ වී වගාව සඳහා පොහොර බෙදාහැරීමේ ක්‍රියාවලියේ නිරත සියලු පාර්ශවයන් සඳහා වූ මාර්ගෝපදේශය**

සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුකූලව මෙරට කෘෂිකර්මාන්තය තිරසර, පරිසර හිතකාමී පද්ධතියක් ලෙස ප්‍රවර්ධනය කිරීම හා සමස්ත කෘෂිකර්මාන්තය සඳහා කාබනික යෙදවුම් පමණක් යෙදවීම සඳහා ක්‍රමවත් පරිදි පියවර ගැනීම අත්‍යවශ්‍ය වේ.

ඒ සඳහා වන සැලසුම්ගත ගමන් මාර්ගයේ එක් පියවරක් ලෙස, 2022 යල කන්නයේ වී වගාව සම්පූර්ණයෙන්ම පරිසර හිතකාමී පොහොර භාවිතයෙන් සිදුකිරීම සඳහා රජයේ පොහොර බෙදාහැරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළව මෙම මාර්ගෝපදේශය සකස් කර ඇත.

මෙම මාර්ගෝපදේශය තුළ රජයේ පොහොර ප්‍රතිපත්තිය, පොහොර ඉල්ලුම් කිරීම, පොහොර බෙදාහැරීම, පොහොර නිසි ලෙස භාවිත කිරීම, අධීක්ෂණය, ප්‍රගතිය වාර්තා කිරීම, සමාලෝචනය හා ප්‍රතිඵල ඇගයීම යනාදී කරුණු ද ඇතුළත් කර ඇත.

දිවයිනෙහි කෘෂිකර්මාන්තයට සම්බන්ධ මෙම ජාතික කර්තව්‍ය මෙම මාර්ගෝපදේශයේ සඳහන් ආකාරයට සාර්ථකව ඉටු කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කාර්යක්ෂමව හා ඵලදායී ලෙස ඉටු කිරීමට මෙම කාර්යය හා සම්බන්ධ සියලුම පාර්ශවයන්හි වගකීම බැව් කාරුණිකව සිහිපත් කරමි.

මෙම මාර්ගෝපදේශයේ සඳහන් ක්‍රමවේද, උපදෙස් සීමාවන් හා කොන්දේසි මැනවින් අධ්‍යයනය කර, සහනාධාර පොහොර වැඩසටහන කන්නය තුළ දී සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය දැනුවත්භාවය අදාළ සියලු නිලධාරීන්ට ලබා දෙන ලෙසත් කාරුණිකව දන්වමි. මෙම මාර්ගෝපදේශයෙහි "පොහොර " යන්නෙන් "පරිසර හිතකාමී පොහොර " යන්න හැඳින්වේ.

මෙම මාර්ගෝපදේශය කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟතාවය සහිතව නිකුත් කරනු ලැබේ.

**එම්.එන්.රණසිංහ**
ලේකම්